# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,879/16 — 1969 නොවැම්බර් 30 වැනි ඉරිද — 1969.11.30**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

### මිළ පාලන පනත

**ආඥාව**

(173 වැනි අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මිළ පාලක (විවිධ ද්‍රව්‍ය), වික්‍රමසිංහ ආරච්චිගේ සනත්කුමාර දේවප්‍රිය සපරමාදු වන මම, පහත සඳහන් පරිදි මෙයින් නියෝග කරමි :—

(1) මෙම ආඥාව, 1969 අංක 8 දරණ (ආනයනය කරන ලද රෙදිපිළි) මිළ පාලන ආඥාව වශයෙන් හැඳින්විය හැකිය ;

(2) මෙම ආඥාව මුළු දිවයිනටම අදාල විය යුතු ය ;

(3) 1969 ජනවාරි 7 වැනි දින හා අංක 14,835/3 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, 1969 අංක 2 දරණ මිළ ආඥාවෙහි 3 (1) දරණ ජෙදයේ දක්වා ඇති රෙදිපිළි විකිණිය යුත්තේ, 24 වැනි වාරයේ සහල් සලාක පොත් මාලාවේ අංක 115, 116 සහ 112 දරණ කූපන හෝ රෙදි පිළි ටෝකන පත්‍රයේ අංක 18, 19 සහ 20 දරණ රෙදිපිළි ටෝකන හෝ, පවරාගෙන පමණි. එවැනි කූපනයක් හෝ ටෝකනයක් අයිතිකරුවාට, ඉහතකී මිළ නියෝගයෙහි 6 වැනි ජෙදයේ දැක්වෙන ආකාරයට ඉදිරිපත් කරනු ලබන එවැනි එක් එක් කූපනය හෝ රෙදි පිළි ටෝකනය හෝ වෙනුවෙන්, එවැනි ආනයනය කරන ලද රෙදිපිළි යාර දෙකකට නොවැඩි ප්‍රමාණයක් ලබාගැනීමේ අයිතිය තිබිය යුතුය.

ඩබ්ලිව්. ඒ. ඇස්. ඩී. සපරමාදු,
මිළ පාලක (විවිධ ද්‍රව්‍ය).

1969 දෙසැම්බර් 1 වැනි දින,
කොළඹ 1.

11–943


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

73 A——ජේ 9016—12,550 (69/11)